ලංකාවිත්ති
LANKA VITHTHI

LANKA VITHTHI
P. O. BOX 64678
LONDON NW3 9LS
ENGLAND

Phone : 02074289388
Fax : 08719005163
E-mail : lanka.viththi @ virgin.net

කර්තෘ : දයා ආනන්ද රණසිංහ
Editor : Daya Ananda Ranasinghe
චිත්‍ර : චන්දන සෙනෙවිරත්න
Art : Chandana Seneviratna
පරිගණක කටයුතු : චන්න කබ්රාල්
Computer Graphics : Channa Cabraal
ඡායාරූප : ආනන්ද කාරියවසම්
Photography : Ananda Kariyawasam



# පුහු ප්‍රාර්ථනා! & රැවටිලි!

සති දෙකකට පෙර දෙසැම්බර් 31 වෙනි දා රෑ දොළහට, එනම්, ජනවාරි 1 වෙනි දා ට පහන් වූ හෝරාව ලබත්ම ලන්ඩනයේ තේම්ස් නදී අසබඩ වෝටර්ලූ පාලම සමීපයේ රැස්වූ ලක්‍ෂ සංඛ්‍යාත පිරිස් උඩ බලාගෙන උන්නේ ඒ අවට අහස ගිගුම් දෙමින් විනාඩි ගණනාවක් පැවති මහා මල්වෙඩි සංදර්ශණය නරඹමිනි. මුළුමහත් ලෝකය පුරා ප්‍රධාන නගරවල මේ ගිනිකෙළි සංදර්ශනය පැවතියේ ය. ලන්ඩන් නගරයේ ඒ මල්වෙඩි සඳහා මෙවර වැය වූ මුදල මිලියන 1.6 ක් යයි ගණන් බලා ඇත. රූපවාහිණී සහ ගුවන්විදුලි මාධ්‍යයෙන් එය හැඳින්වූයේ නව වසර පිළිගැනීමක් වශයෙනි.

මේ අළුත් අවුරුද්ද සැමරුම මේ ආකාර යෙන් හැම වසරකම අවසාන දිනයේ සිදුවෙයි. වෙනසකට ඇත්තේ අවුරුද්දෙන් අවුරුද්ද ඒ මල්වෙඩි සඳහා වැයකරන මුදල් ප්‍රමාණය වැඩි කිරීම පමණකි. විනාඩි දහයකට පුච්චා දැමූ රතිඤ්ඤා සහ වෙනත් මල්වෙඩි සඳහා වැය වූ ඩොලර් මිලියනයකට වැඩි මුදල් ද පුච්චා දැමූ මුදල් කන්දරාවක් නොවේ ද? ඒ මුදල් ප්‍රයෝජනවත් දේකට වැයකරන්නට හෝ සාගත යෙන් පෙළෙන දිළින්දන්ට ආහාර වේලක් දෙන්නට හෝ මොළයක් හිතක් මේ ධනපති බටහිර රටවලට පෑදුනේ නැත. මතු කිසිදාක ද එසේ සිතෙන්නේ නැති බව ද අපට සහතික ය.

1 වෙනිදා ප්‍රීතිවූ නමුත්, 2 වෙනිදා සිට පරණ සිංදුවය. එනම්, වැඩට යා යුතුය. අළුත් අවුරුද්දේ දුම්රිය සහ බස් ගාස්තු වැඩිවෙයි. බඩුමිළ ඉහළ ගොස් ඇත. පැට්‍රල් ඩීසල් ඉහළ ගිහිල්ලා ය. විදුලි ගාස්තු වැඩිකරන බවට ලිපියක් ගෙදරට ලැබේ. බලන හැම තැනම සාප්පුවල ද, ඔක්ස්ෆර්ඩ් වීදියේ ද සේල් පටන් ගෙන ඇත. එහෙත් ඒ කිසිදු බඩුවක මිළ එතරම් අඩු වී නොමැත. ඇතැම් ඇඳුම් හා පාවහන් සේල් නැති කාලයේ අඩුවට තිබුණා අපට මතක ය. ටෙලිවිෂන් ලයිසන් ගාස්තුව £145. 50 කි. බලන්න දෙයක් ටෙලිවිෂනයේ ඇත්තේ ද නැත. එහෙත් ඒ ගණන ගෙවිය යුතුම ය. හැම තැන දැන් පැතිරෙන උණ රෝගයෙන් බේරෙන්නට ෆ්ලූ ජැබ් එක හෙවත් ඉන්ජෙක්ෂන් එක ගහගත් නමුත් උණ සෑදී අමාරු වෙයි. රජය තව තවත් අත්‍යවශ්‍ය සේවාවන් කපා දමයි. ඇෆ්ගනිස්ථාන් යුද්ධයෙන් මියගිය බ්‍රිතාන්‍ය සොල්දාදුවන්ගේ සිරුරු දැන් තවමත් සතියකට වරක් රටට ගෙන එති.

කාරණා මෙසේ නම් හැම අවුරුද්දේම මේ වන පැය කීපයක ප්‍රීතියට පසු මිනිස්සුන් පතන නව අවුරුදු ප්‍රාර්ථනා තම තමන් රවටා ගැනීමක් පමණක් නොවේද? මේ මායාවක් බව දකින්නට කිසිවෙකුට ඇස් නැත. ඒ මායාවට සෑම වසරකම අවසානයේ අසුවීමට තරම් මිනිසා නවීන තාක්‍ෂණය මගින් මෙහෙයවනු ලැබ ඇත. තාක්‍ෂණය දියුණුවෙත්ම ඔහු මනසින් පිරිහෙයි. ඉටු නොවන ප්‍රාර්ථනා පතති. ලෝකය ඉබේම යහපත් වේයයි ඔව්හු සිතති. කිසිදාක එසේ වන්නේ නැත. අද ලෝකයේ පවතින්නේ ස්වභාව ධර්මය විසින් නොව, මිනිසා විසින් මවන ලද ප්‍රශ්න හා වැරදි ය. මිනිසාම ඒ වරදේ ප්‍රධානම කොටස වන කල, ඒ වැරදි නිවැරදි වන්නේ කෙසේද? කවදාද?

# For all wayfarers...!

# සියළු සංචාරකයින් සඳහා

**By Kwee Lain ක්වී ලේන් විසිනි**

Remember always that you are just a visitor here, a traveler passing through.Your stay is but short and the moment of your departure unknown.

None can I live without toil, and a craft that provides your needs is a blessing indeed. But if you toil without rest, fatigue and weariness will overtake you, and you will be denied the joy that comes from labour's end.

Speaking quietly and kindly and be not forward with either opinions or advice. If you talk much, this will make you deaf to what others say, and you should know that there are few so wise that they cannot learn from others.

Be near when help is needed, but far when praise and thanks are being offered.

Take small account of might, wealth and fame, for they soon pass and are forgotten. Instead, nurture love within you and strive to be a friend to all. Truly, compassion is a balm for many wounds.

Treasure silence when you find it, and while being mindful of your duties, set time aside, to be alone with yourself.

Cast off pretense and self-deception and see yourself as you really are.

Despite all appearances, no one is really evil. They are led astray by ignorance. If you ponder this truth always you will offer more light, rather than blame and condemnation.

You, no less than all beings, have Buddha Nature within. Your essential Mind is pure.

Therefore, when defilements cause you to stumble and fall, let not remorse nor dark foreboding cast you down. Be of good cheer and with this understanding, summon strength and walk on.

Faith is like a lamp and wisdom makes the flame burn bright. Carry this lamp always and in good time the darkness will yield and you will abide in the light.

**When you have the lamp, we know you are safe !**



මතක තබාගන්න! ඔබ මේ ලෝකය හරහා යන සංචාරකයෙකු පමණකි. ඔබට නැවතී සිටීමට තිබෙන්නේ සුළු වේලාවකි. පිටවී යන්නේ කොයි මොහොතේදැයි කියාවත් ඔබ නොදනී. ජීවිතය ගෙනයාම සඳහා යම් යම් කාර්‍යයන්හි යෙදෙන්නට අවශ්‍යය. එය ඔබේ ජීවන වෘත්තිය වෙයි. සෑම කෙනෙකුටම ජීවත්වීමට එය අවශ්‍යය. එහෙත් ඔබ කිසිදු විවේකයක් නැතිව දිගටම වැඩ පළවල යෙදුණහොත් ඔබ වෙහෙසට පත්වන්නෙහිය. අවසානයේ ඔබ ලබන ජයග්‍රහණයන්ගේ ප්‍රීතිය විඳීමට ඒ තෙහෙට්ටුව ඉඩ නොදේ.

සාමාන්‍ය ස්වරයෙන් හා කරුණාවෙන් කතකරන්න. ඒ කතා බහේදී ඔබගේ මතයන් සහ උපදෙස් අන් අයට පටවන්න එපා. ඔබ දිගටම කතා කිරීම නුසුදුසුය. එවිට අනෙක් අය කියනදේ ඔබට අසන්නට නොලැබේ. අනෙක් අයගේ අදහස් දැනගන්නට නොලැබේ. එතැන බුද්ධිමතුන් වුවහොත් ඔවුන්ගේ කතා බහෙන් ප්‍රයෝජනවත් යමක් එකතුකර ගන්නට ඔබටවත් කාටවත් නොලැබෙයි. මක්නිසාද ඔබ දිගටම නොනවත්වා කතා කළ නිසා ය.

කාටහෝ උදව් අවශ්‍ය තන්හිදී ඔබ ඔවුන්ට සමීපව සිටින්න. නමුත් ස්තුති ප්‍රශංසා ආදිය පුද කරන අවස්ථාවන්හි ඈත් වී සිටින්න. බලපුළුවන්කාරකම්, ධනය හා ප්‍රසිද්ධිය ආදී දේවල් ජීවිතයේ එපමණ සැලකිය යුතු දේ ලෙස ගණන් ගන්නට එපා. මක්නිසාද ඒ දේවල් ඉක්මනින් වියැකී අමතකව යන දේවල් නිසාය. ඒ වෙනුවට ඔබ තුළ දයාව කරුණාව දියුණු කරමින් කාටත් හොඳ මිත්‍රයෙකු වන්නට උත්සාහ කරන්න. සැබැවින්ම දයානුකම්පාව බොහෝ තුවාල සුවකරන ඖෂධා ලේපයක් වෙයි.

නිශ්ශබ්දව නිස්කලංකව ඉන්නට ඔබට ලැබෙන හැම මොහොතක්ම ඉතා වටිනා බව සිතන්න. ඔබෙන් ඉටුවන සේවයන් ගැන පැහැදිලි අවබෝධයෙන් යුතුව අවදියෙන් සිටින අතර අනෙක් දේවලින් මඳක් ඈත්වී ඔබගේම ලෝකයට පිවිසී හුදකලා වන්නට ද කාලයක් සොයාගන්න.

බොරු මවා පෑම්, ආත්ම වංචාවෙන් තොරව සැබෑ ඔබ කවරෙක්ද යන්න මතු කරගෙන ඒ පුද්ගලයා දෙස බලන්න. එවිට ඔබ දකින්නේ ඔබගේ යථා ස්වරූපයයි.

පුද්ගලයින් පිටතින් කොයි අන්දමට පෙනුණත් ඒ කිසිකෙනෙක් සැබැවින්ම නරක නපුරු අය නොවෙති. ඔවුන් අඥාන කම නිසා නොමග ගිය අයයි. මෙම සත්‍යය ඔබ අවබෝධකරගත හොත් යම් අවස්ථාවන්හි ඔබ අන් අයට දොස් පැවරීමට හෝ ඔවුන් නිර්දයලෙස හෙලාදැකීමට හෝ තැත් නොකර වෙනත් පැහැදිලි එළියක් තුළින් ඔවුන් දෙස බලන්නට යොමු වෙනවා ඇත. ඔබද ඇතුලු සෑම කෙනෙකු තුළම බෝසත් ගුණාංග පවතින බව සිතන්න.

විශ්වාසය පහනකි. බුද්ධිය එහි දැල්ලයි. මේ පහන අතැතිව ඉන්න. කොයි වෙලේ හෝ අඳුර විත් වටකරගත්තද කමක් නැත. ඔබ ඉන්නේ ආලෝකය සමග ය.

# ❊ නව සහශ්‍රයට ධර්මානුශාසනා ❊

## හිතොපදේශයෙන්

ආනන්ද මූල ගුණ පල්ලව තත්ව සාඛා
වෙදාන්ත පුෂ්ප ඵලමොක්‍ෂ රසෙශ්ච පූර්ණම්
ජාතො විහංග ඉව කල්පතරුං විහාය
සංසාර දුක්ඛ විටපො වත කිං කරොති
(ප්‍රත්‍ය ශතකය - 99)

*අර්ථය : ප්‍රමෝදය නමැති මුලින්ද, ගුණ නමැති පල්ලවයෙන්ද, තත්ව නමැති ශාඛායෙන්ද, වේදාන්ත නමැති මලින්ද, මොක්‍ෂ නමැති ඵල රසයෙන්ද සම්පූර්ණ වූ කල්පවෘක්‍ෂයෙහි ඵල අනුභව නොකොට ජාති විහඟුන් (කුරුල්ලන්) කල්ප වෘක්‍ෂය හැරගොස් තැනින් තැන පිපාසයෙන් වැලපෙන්නාක් මෙන් එම කල්පවෘක්‍ෂයෙහි මෝක්‍ෂ රස නමැතිඵල අනුභව නොකොට සසරේ අනේක දුක් විඳින්නේ කවර ප්‍රයෝජනයක් නිසාද?*

සසරගත සත්වයින් ඉන් මිදීමේ මං නොසොයා, ඒ මිදීමේ මං හැරදමා, අනේක විධ දුක්ගැහැට විඳිමින්, ඇතැම් විට ඒ දුක්ම සැපයයි සිතමින්, පීඩාවට පත්ව පෙළෙන අයුරු මෙයින් පෙන්වා දෙයි.

කල්ප වෘක්‍ෂයේ හටගන්නාවූ, මෝක්‍ෂරසයෙන් යුතු අමාඵලය අනුභව කිරීම සංසාරගත සත්වයන්ගේ දුක්ඛ පීඩාවන් සමනය කරගැන්මේ මාර්ගයයි. එම කල්පවෘක්‍ෂයද අප අසා ඇති හුදු කල්ප වෘක්‍ෂයක් නොවේ.

වෘක්‍ෂයෙහි මුල ආනන්දය හෙවත් සතුටය. එබැවින් වෘක්‍ෂය ප්‍රමෝදය, ප්‍රීතිය හා සතුට නමැති මල්වලින් යුක්ත වූවකි. ඒ මලින් හටගන්නාවූ ඉතාමත් සුභ සහ සාර මිහිරි ඵල ගෙනදීමට වෘක්‍ෂය සහතික වේ. එහි පත්‍ර පරොපකාරය, පරිත්‍යාගශීලීබව, කරුණා මුදිතා කෘතවේදී බව වැනි උතුම් ගුණයන්ගෙන් යුතු ඒවාය. මෙම වෘක්‍ෂයේ ශාඛා ඉතා උසස් ගණයේ තත්වයෙන් යුක්තය. සීල සංවරයෙන්, තපසින්, ප්‍රඥාවෙන් යුක්ත ශාඛා ප්‍රශාඛාවෝ පහසුවෙන් වැනසී නොයන, පහසුවෙන් වැනසිය නොහැකි ශක්තිමත් ඒවා වෙති. තවද මෙහි අග්‍රඵල ලබාදෙන පුෂ්ප යන්ද සුවිශේෂීය. ධර්මාවබෝධයෙන් තත්වා වබෝධයෙන් නිර්මල වූ, සුගන්ධවත්වූ, පුෂ්ප මකරන්ද යන්ගෙන් ගහණ වූ අලංකෘත වූවකි. එහෙයින් එවන් ගසක ඵල හා ඵල රස ගැන කියනුම කවරේද? මෙහි ඵලය මෝක්‍ෂයයි. එය අනුභව කරන්නා සදාකල් නිවී සැනසීමට පත්වන්නේය. "නාස්ති මෝක්‍ෂ සමං රසං" යන කියමනට අනුව මෝක්‍ෂ රසය නමැති උතුම් රසයක් මේ තුන් ලොවෙහිම තවත් නැත. එම රසය දුක්ඛ දෝමනස්ස සියල්ල සමනය කොට යළි යළි ඉපදෙමින් මැරෙමින් විඳින පීඩාවල අවසානයයි.

එහෙත් මෙහි පෙන්වා දෙන දෝෂය නම් මෝහයෙන් මුලාවූ සැවොම ඒ අමා ඵල පෙනි පෙනී තිබියදීත් අන්ධ වූවන්සේ ඒවා බුදින්නේ නැතිව මංමුලාවූවන්සේ එමගින් බැහැරවීමයි. මෙහි දැක්වෙන උපමාව ඊට කදිම නිදසුනකි.

සා පිපාසාවෙන් පෙලෙන පක්‍ෂීන් ගණවූ අතුපතරින් ගැවසීගත් සුවඳ මලින් අමාරසයෙන් යුත් ගෙඩිවලින් යුත් එම ගස හැර දමා කිසිවන් නොමැති කතරක තනිව පීඩාවට පත්ව දුක්විඳින්නාක් මෙන් අපද ලෞකිකවූ භෞතික සැප සම්පත් ගැනම සිත සිතා ඒවා ලබාගැන්මේ අධිෂ්ඨානයෙන් ඒ පසුපස හඹා යාමයි. අප ඉන් යමක් ලබාගත්තද ඉන් සෑහීමට පත් නොවී එම නොසන්සිඳෙන ආශාවෙන් පීඩාවට පත්වෙමින් අවුල් වූ මනසින් යුක්තව අප ඉන් යමක් ලබාගත්තද ඉන් සෑහීමට පත් නොවී එම නොසන්සිඳෙන ආශාවන්ගෙන් සැමදා පීඩාවට පත්වෙමින් අවුල් වූ මනසින් යුක්තව අවුල් කරගත් ජීවිත ගෙවමින් තමන්ටත් අනුන්ටත් යහපත උදාකර නොගනිමින් තමන්ටත් අනුන්ටත් අනර්ථයම සිදුකර ගනිමින් අනේක දුක්ම අනුභව කරමින් කල්ප කාලවල සුසුම් හෙලමින් මේ නොනවතින සසර ගමන ඇවිද යන බව මේ පද්‍යයෙන් දෙන උතුම් පාඩමයි.



♦ රාජකීය පණ්ඩිත - ශාස්ත්‍රපති
**පූජ්‍ය විල්ඔය විමලජෝති හිමි**
**ලන්ඩන් බෞද්ධ විහාරය**
**London Buddhist Viharaya**
**The Avenue, London W4 1UD**

**NORMA & Co**
**Associate Solicitors**

2 Queens Parade
Green Lanes, London N8 0RD
Tel. 020 8348 7772 / 07717173414

Any type of Visa Applications
Car Accidents

**Colombo Office**
Visa Applications & Any Refusals
100/6 Rosemead Place
Colombo 7
Tel. 2672432 / 0777686632